**ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -2024**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 267 - මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනුලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජංගම නොවන වත්කම් අයිතම 05 ක 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.792,328,720 ක් ලෙස දක්වා තිබුණද, ඒවා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය වශයෙන් ACA - 6 (SA – 82) ආකෘතියේ රු.809,160,653 ලෙස දක්වා තිබීමෙන් රු.16,831,933 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | විධිමත් පරිදි සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමටත් සිදු කරන ලද ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව, ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම් වටිනාකම රු. 37,663,044 ක් වූ අතර භාණ්ඩාගාර ආකෘති අංක SA -82 අනුව එය රු.26,163,044 ක් ලෙස දක්වා තිබීමෙන්, රු.11,500,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදාළ වටිනාකම් CIGAS හරහා නිසි ලෙස උඩුගත කර ඇති නමුත් භාණ්ඩාගාර ආකෘතිය (SA 82) හි ඇතුළත් කර නොමැති බැවින් මෙම වෙනස ඇති වී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර ආකෘති සමඟ සසඳා නිවැරදි ශේෂ පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර අදාළ නිවැරදි කිරීම් කඩිනමින් සිදු කරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපනය කර තිබූ සූර්ය බලශක්ති උත්පාදන පද්ධතිය සවිකිරීමේ රාමුව සඳහා ගෙවා තිබූ රු.1,279,956 ක ප්‍රාග්ධන වියදම, ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු යන වැය විෂය යටතේ පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී එවැනි වැරදි සිදු නොකිරීමට කටයුතු කරනු ලැබේ. | වියදම් නිවැරදි වර්ගීකරණයන්ට අනුව ගිණුම්ගත කිරීමටත් වත්කම් ශේෂය නිවැරදිව දැක්වීමටත් පියවර ගත යුතුය. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ මූල්‍ය ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ රු.5,087,191 ක් වටිනා ප්‍රාග්ධන ව්‍යාපෘති 03 ක් ගොඩනැගිලි සහ ඉදිකිරීම් යටතේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, එය වත්කම් පුනරුත්තාපන සහ වැඩිදියුණු කිරීම යන පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීම් ශීර්ෂය යටතේ වෙන් කර ඇති මුදල ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් නිම කිරීමට ප්‍රමාණවත් නොවීය. | - එම - |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචන සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම්ද කරනු ලැබිය යුතුය. එමෙන්ම එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරක් ලබා දී නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය අනුව කටයුතු කර විගණනයට වාර්ථා කළ යුතුය. |

### 3.2 අත්තිකාරම් ලබාදීම සහ පියවීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විවිධ සේවා සමුපකාර සමිති 02 කට වී මිලදී ගැනීම සඳහා ලබා දුන් රු.20,729,785 ක මුළු අත්තිකාරම් මුදලෙන් රු. 11,609,125 ක් හෙවත් සියයට 56ක් මේ දක්වා පියවා නොතිබුණි. | දැනට විශ්වමඩු ගොවි සංගමයෙන් 2025 අප්‍රේල් 30 දින රු.250,000 ක් ගෙවා ඇති අතර, අයවිය යුතු ශේෂය රු.10,300,000 ක් වේ, පනංගමම්පට්ටු විවිධ සේවා සමුපකාර සංගමයෙන් අයවිය යුතු ශේෂය රු.1,309,125 කි. | විධිමත් පරීක්ෂණයක් පවත්වා අත්තිකාරම් මුදල් කාලීනව අය කිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනිමටත් අයවිය යුතු අත්තිකාරම් මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමත් කළ යුතුය. |

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සහ 2021 වර්ෂයේ දී සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04ක ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 04ක් සඳහා රු.26,473,450 ක් වියදම් කර තිබූ අතර, එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු වන නිෂ්පාදන ගම්මාන නිර්මාණය කිරීම තුළින් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, විරැකියාව අඩු කිරීම, දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ජාතික නිෂ්පාදනය වැඩි කිරීම යන අරමුණු සාක්ෂාත් කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා විධිමත් අධීක්ෂණයක් හා පසු විපරමක් සිදු නොකළ නිලධාරීන්ට පියවර ගැනීමත් නිශ්චිත කාල රාමුව තුළ ව්‍යාපෘති වලින් උපරිම ප්‍රතිලාභ සහ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වැඩපිළිවෙලක් සැකසීමත් කළ යුතුය. |

**4.2 ව්‍යාපෘති සම්පූර්ණ නොකර අත්හැර දැමීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාන්තායි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂයේදී ආරම්භ කර රු.3,657,500 ක වියදමක් දරා අතරමඟ නවතා දමා තිබූ ව්‍යාපෘත් 08ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද සම්පූර්ණ නොකර නිෂ්ඵලව පවතින බව නිරීෂණය විය | කර්මාන්ත 04 ක් මැතිවරණ කාලය තුළ ඇති වූ දේශපාලන වෙනස්කම් හේතුවෙන් අත්හිටුවන ලදී. ඉතිරි කර්මාන්ත 04 වැඩ පරිසරයේ සහ දේශගුණයේ සෘණාත්මක බලපෑම් හේතුවෙන් අතර මග නවතා ඇත. | සංවර්ධන ව්‍යාපෘති නිසි අධීක්ෂණයකට ලක් නොකළ නිලධාරීන් සම්බන්ධ පියවර ගැනීමත්, ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදු කර ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඵලදායීව ඉටුකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**5. තිරසාර සංවර්ධන ඉලක්ක ළගාකර ගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතට අනුව, 2030 වන විට තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂිකව සපුරා ගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාමාර්ග සහ ඒවායේ ප්‍රගතිය මැනීම සඳහා වන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඊට අදාළ ප්‍රගතිය අත්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 වන දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06ක අනුමත කාර්ය මණ්ඩලය 703ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩල 594 ක් විය. එදිනට පුරප්පාඩු 207 ක් හා අතිරික්ත කාර්ය මණ්ඩල 98 ක් පැවති බව නිරීන්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අවශ්‍යම පුරප්පාඩු පමණක් පිරවීමටත් අතිරික්ත කාර්ය මණ්ඩල වෙනත් ආයතනවලට අනුයුක්ත කිරීමටත් පියවර ගත යුතුය. |